# කොළඹ විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව
# නීති පීඨය
# නීතිවේදී ගෞරව උපාධිය

## පළවන සෙමෙස්තර අවසාන පරීක්ෂණය - III වසර - 2025

## LAW31303 - සමාගම් නීතිය

**(පැය 2 ¼)**

**මුළු ප්‍රශ්න ගණන: 04**

**ඕනෑම ප්‍රශ්න දෙකකට (02) පමණක් පිළිතුරු සපයන්න.**
**(අයදුම්කරුවන්ගේ අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කෙරේ.)**

---

**(01)** FINE-LAND රාජ්‍යයේ ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ මහලේකම්වරයාගේ නීති හා පර්යේෂණ සහායකයකු ලෙස, මෑතකදී ඔබව පත් කර ඇත. මහලේකම්වරයා වර්තමානයේ විශේෂයෙන් විගණකාධිකාරීන්, නීතිඥයින් සහ ගිණුම් උපදේශකයින් වැනි වෘත්තිය සේවා සපයන්නන් අතර හවුල් ව්‍යාපාර ප්‍රවර්ධනය කිරීමේ අරමුණැති පියවරක නියැලී ඇත. මෙහි මූලාරම්භයක් ලෙස "*FINE-LAND රාජ්‍යයේ හවුල් ව්‍යාපාරයක නීතිමය අවශ්‍යතා*" යන ශීර්ෂයෙන් පුවත්පත් ලිපියක් ලියන ලෙස ඔබෙන් ඉල්ලීමක් කර ඇත. මෙම ලිපිය මගින් වෘත්තිකයන් හවුල් ව්‍යාපාරයන්හි නියැලීම දිරි ගන්වන හේතු සපයන තොරතුරු සහ නිත්‍යානුකූලව නිවැරදි කරුණු ඉදිරිපත්කිරීම අපේක්ෂා කරයි.

FINE-LAND හි නීති පද්ධතිය ශ්‍රී ලංකාවේ නීති පද්ධතියට සමාන බවත්, වාණිජ කටයුතු සම්බන්ධයෙන් ඉංග්‍රීසි පොදු නීතිය අදාළ වන බවත් උපකල්පනය කරමින්, ඔබේ ලිපිය මගින්, FINE-LAND හි හවුල් ව්‍යාපාර ආශ්‍රිත නීතිමය රාමුව පිළිබඳ සම්පූර්ණ විශ්ලේෂණයක් ලබාදිය යුතුය.

හවුල් ව්‍යාපාරයක් ආරම්භ කිරීමේ ක්‍රියාවලිය සහ අවශ්‍යතා මෙන්ම නීතිමය වශයෙන් හවුල් ව්‍යාපාරයක් පවතින බව තීරණය කිරීමට භාවිත කරන මූලධර්ම පිළිබඳ විශේෂ අවධානය යොමු කරමින් හවුල් ව්‍යාපාරයන් සඳහා බල පැවැත්වෙන නීතිමය රාමුව පිළිබඳව සාකච්ඡා කරන්න. ඔබේ පිළිතුර යටතේ, හවුල් ව්‍යාපාරයක් සතු නෛතික පුද්ගලභාවයේ ස්වභාවය සහ පුද්ගලයින්ට හවුල් ව්‍යාපාරයකට සම්බන්ධවීම සඳහා අවශ්‍ය වන නීතිමය හැකියාව පිළිබඳව පරීක්ෂා කළ යුතුය. එමෙන්ම කැමැත්ත මත ඇතිවන හවුල් ව්‍යාපාර (**partnership at will**) ස්ථාපනය කිරීමේ ප්‍රතිඵල සහ අන්‍යොන්‍ය නියෝජිතත්ත්වය (**mutual agency**) පිළිබඳව සහ විශේෂයෙන් ම හවුල් ව්‍යාපාරකරුවන්ගේ බලතල සහ හවුල් ව්‍යාපාරයේ වගකීම කෙරෙහි එය බලපාන ආකාරය විශ්ලේෂණය කරන්න. ඔබගේ සාකච්ඡාව යටතේ හවුල් ව්‍යාපාර ආශ්‍රිත හුවා දැක්වීම (**holding out**) පිළිබඳ මූලධර්මය සහ වගකීම තීරණය කිරීමේ දී එහි අදාළත්වය මෙන් ම, හවුල් ව්‍යාපාරයක් විසිරුවා හැරිය හැකි නීතිමය පදනම් සහ ක්‍රමවේද කෙරෙහි අවධානය යොමු විය යුතුය.

ඔබගේ ලිපිය වෘත්තීමය සහ සංවිධානාත්මක අයුරින් සැකසිය යුතු අතර, අදාළ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සහ නඩු තීන්දු උපුටා දැක්විය යුතුය.

(ලකුණු 30)

**(02) (අ) සහ (ආ) <u>කොටස් දෙකටම</u> පිළිතුරු සපයන්න.**

**(අ) කොටස**

ඔස්ටින්, නිලෝනි සහ සංජේ 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සංස්ථාපිත සමාගමක් වන Priston Marketing PLC (සමාගම) හි අධ්‍යක්ෂ මණ්ඩලයට ඒකමතිකව තේරී පත්ව ඇත. සමාගමේ ව්‍යවස්ථාවලියට අනුව එහි ප්‍රධාන ව්‍යාපාරය වනුයේ දේශීය සහ ජාත්‍යන්තර වෙළඳපොළ වෙත වීදුරු බහාලුම් නිෂ්පාදනය කිරීම සහ විකිණීමයි. සමාගමේ මුළු වත්කම් හි වටිනාකම රුපියල් මිලියන 3,000ක් වේ. රුපියල් මිලියන 1950ක ඇස්තමේන්තුගත වියදමක් යටතේ 2025 වසරේ සැප්තැම්බර් මාසයේදී, උඳුන් අළුත්වැඩියා කිරීමේ ව්‍යාපෘතියක් ඇරඹීමට, සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කළේය. කෙසේවුවද අධ්‍යක්ෂ මණ්ඩලය, එවන් සැලකිය යුතු ගණුදෙනු සම්බන්ධයෙන් පනත අනිවාර්යය කොට දක්වා ඇති නෛතික ක්‍රියාපටිපාටීන්ට අනුගත වී නොමැත. ඒ සමගම ඔස්ටින්, සිය බිරිඳ මනෝරි, සුපර්ස්ටාර් මැන්පවර් (පෞද්) සමාගමෙහි ප්‍රධාන විධායක නිළධාරිනිය බව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත හෙළිදරව් නොකරමින්, සුපර්ස්ටාර් මැන්පවර් (පෞද්) සමාගම ඉදිරිපත් කළ ශ්‍රම සේවා සැපයීම සඳහා වන ටෙන්ඩරය අනුමත කළේය. මීට අමතරව සමාගමේ මූල්‍ය අධ්‍යක්ෂක සංජේ, 2024 වසරේ පටන් සමාගම ආශ්‍රිතව මූල්‍යමය අස්ථාවරත්වයක් පවතින බව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පෙන්වා දුන් අතර, කෙසේ වුවත් අධ්‍යක්ෂ මණ්ඩලය කාලීනව අවශ්‍ය නිසි ක්‍රියාමාර්ග ගැනීමට හෝ වාර්තා කිරීමට අපොහොසත් විය.

ඉහත සිද්ධිදාමය ඇසුරින් පැන නැගෙන නෛතික ගැටළු අදාළ සමාගම් නීති මූලධර්ම, අදාළ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සහ නඩු තීන්දු ඇසුරින් සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

**(ආ) කොටස**

"සුප්‍රකට නඩු තීරණයක් වන Salomon *v A. Salomon & Co. Ltd* [1897] AC 22 මගින්, සමාගමක් එහි කොටස් හිමියන්ගෙන් වෙන්වූ ස්වාධීන නෛතික අස්තිත්වයක් (separate legal entity) බවට පත්වන මූලික නීතිමය මූලධර්මය ස්ථාපිත කරන ලදී. මෙම මූලධර්මය මගින් සාංගමික කඩතුරාව (corporate veil) යන සංකල්පය හඳුන්වා දුන් අතර, එමගින් සමාගමේ ණය සහ වගකීම් සම්බන්ධයෙන් කොටස් කොටස් හිමියන්ගේ පෞද්ගලික වගකීමෙන් ඔවුන්ව ආරක්ෂා කරයි."

සාංගමික කඩතුරාව යන්න ඉවත්කළ නොහැකි හෝ සිදුරු කළ නොහැකි ස්ථාවර සහ අත්‍යන්ත සංකල්පයක් බවට ඔබ එකඟ වන්නෙහිද? අදාළ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සහ පසුකාලීන අධිකරණ වර්ධනයන් අනුසාරයෙන් ඉහත ප්‍රකාශය විවේචනාත්මකව විමර්ශණය කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 30)

**(03)** සාංගමික යහපාලනය සහ සාංගමික සමාජ වගකීම අතර පවත්නා සම්බන්ධතාවය විමර්ශනය කරන්න. නූතන කාර්යක්ෂම සාංගමික යහපාලන රාමු ව්‍යුහය මඟින්, සමාගම් ආශ්‍රිතව සැබෑ සාංගමික සමාජ වගකීමක් කෙතරම් දුරට ප්‍රවර්ධනය කළ හැක්කේ ද? ඔබේ පිළිතුර යටතේ 2007 අංක 07 දරණ සමාගම් පනත ඇතුළුව ශ්‍රී ලංකාවේ පවතින නීතියම සහ නියාමන රාමුවේ ප්‍රමාණවත් බව විමසා බලන්න..

(ලකුණු 30)

**(04)** රවී, ශ්‍රී ලාංකීය සමාගමක් වන ABC Holdings (Pvt) Ltd. හි සුළුතර කොටස් හිමියෙකි. මෑතකදී, අධ්‍යක්ෂ මණ්ඩලය පාලනය කරන බහුතර කොටස් හිමියන්, සමාගමට අයත් සැලකිය යුතු වාණිජමය දේපලක්, අධ්‍යක්ෂවරයෙකුට අයත් සම්බන්ධිත ආයතනයකට, වෙළඳපල වටිනාකමට වඩා බෙහෙවින් අඩු මිලකට විකිණීමට අනුමැතිය ලබා දුන්නේය. රවී මෙම ගනුදෙනුව පිළිබඳ ව දැන නොසිටි අතර, ඊට අදාළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා වෙත ප්‍රවේශය ඉල්ලා සිටි විට එයද ප්‍රතික්ෂේප කළේය. ඊට අමතරව තීරණාත්මක කාරණා සාකච්ඡා කිරීම සඳහා රැස්වීම් කැඳවීමට සමාගම මැලිකමක් දක්වන බව රවී අවධාරණය කළේය. ඒ වනවිට සමාගම, සමාගම් ආශ්‍රිත තීරණ ගැනීමේ දී සුළුතර කොටස් හිමියන්ගේ නිසි සහභාගීත්වය ඉවත් කරමින්, නිතරම රැස්වීමක් වෙනුවට යෝජනා සම්මතයක් ඇති කරගත්තේය.

2007 අංක 7 දරන සමාගම් පනත හා අදාළ නඩු තීන්දු අනුසාරයෙන්, ඉහත තත්ත්වය සම්බන්ධව රවී වෙත ලබාගත හැකි නීතිමය පිළියම් කවරේද යන්න ඔබේ පිළිතුර සාධාරණීකරණය කරමින් විශ්ලේෂණය කරන්න.

(ලකුණු 30)

***********